**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**
**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 1 සේවා ගණය (MN-2 ) සඳහා වන**
**1/2/3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2019**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - බණ්ඩ 1 සේවා ගණය (MN-2) සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන අනුව පැවැත්වීමට නියමිත 1 වන 2 වන හා 3 වන කාර්යක්ෂතා කඩඉම් විභාග 2019 ඔක්තෝම්බර් මස අවසන් සතියේ සිට පැවැත්වෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. උක්ත විභාගය කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

03. මෙම විභාගය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

04. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන සියළුම විභාග නීති රීති පිළිපැදීමට සෑම විභාග අපේක්ෂකයෙකුම බැඳී සිටී.

05. **විභාගය සඳහා අයදුම් කිරීම**

i. මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතුය.
ii. ආදර්ශ අයදුම්පත්‍රයේ දක්වා ඇති පරිදි අංක 01 සිට 05 දක්වා කොටස පළමු පිටුවට ද, ඉතිරි කොටස දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි A- 4 ප්‍රමාණයේ එක් කඩදාසියක දෙපැත්ත භාවිතා කර පරිගණක ගත කර සම්පූර්ණ කල යුතුය.
iii. අයදුම්කරුවකු විසින් එක් විභාගයක් සඳහා ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම් පතක් පමණි.
iv. විභාග එකකට වැඩි ප්‍රමාණයක් සඳහා අයදුම් කරන නිලධාරීන් එක් එක් විභාගය සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් එවිය යුතු අතර අයදුම් කරනු ලබන්නේ කී වැනි විභාගයද යන්න හා අදාල විෂයයන් ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය.
v. විභාග අයදුම්පත ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු අතර සහතික කරන්නාගේ නිල මුද්‍රාව තැබිය යුතුය.
vi. සියළුම අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අදාළ ස්ථානයේ ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තිබිය යුතුය.
vii. අදාළ අයදුම්පත් සහිත ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන විභාගයේ නම සහ I වන II වන හෝ III වන කාර්යක්ෂතා කඩඉම් විභාගයද යන්න ඉතා පැහැදිලිව අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.
viii. අදාළ උපදෙස් අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් තම ආයතන ප්‍රධානියා මගින් **2019.10.14** දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **අධ්‍යක්ෂ ජනරාල්, විභාග ඒකකය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 4 වන මහල, සෙත්සිරිපාය, පළමු අදියර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

06. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම විභාගය සඳහා අදාළ උපදෙස් පරිදි අයදුම් කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ.

08. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් පතෙහි සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

09. විභාග පිළිබඳ විස්තර:
විභාග අපේක්ෂකයන් විසින් පහත දැක්වෙන විභාග විෂය නිර්දේශ වලට අදාළ ලිඛිත විභාග අතරින් තමා අයදුම් කර ඇති විභාග සඳහා පෙනී සිටිය හැක.

09.1.a පළමු (1) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටික රීති | පැය 02 | 100 | 40% |
| 02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

09.1.b පලමු (1) වන කාර්යක්ෂතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

<table>
<tr><th>ප්‍රශ්ණ පත්‍රයේ නම</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>01. කාර්යාල ක්‍රම හා කාර්ය පටිපාටික රීති</td><td>රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබද අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම හා ඒවා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමද අපේක්ෂා කෙරේ.</td></tr>
<tr><td>02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය</td><td>රජයේ කාර්යාලවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සාමාන්‍ය සංකල්ප සහ තොරතුරු තාක්ෂණය මනාසේ උපයෝගී කර ගැනිම පිළිබඳව දැනුම මෙමගින් පරීක්ෂා කෙරේ.<br>ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.<br><table><tr><th>ප්‍රශ්න පත්‍රය</th><th>කාලය</th><th>ලකුණු</th></tr><tr><td>1 වැනි ප්‍රශ්න පත්‍රය බහුවරණ</td><td>පැය 01</td><td>40%</td></tr><tr><td>2 වැනි ප්‍රශ්න පත්‍රය රචනාමය ප්‍රශ්න</td><td>පැය 02</td><td>40%</td></tr></table>රජයේ ආයතනයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා වන ආකාරය, පරිගණක ජාල සහ දත්ත සන්නිවේදනය පිළිබඳ මනා දැනුම, පොදු කාර්ය මෘදුකාංග පිළිබඳ දැනුම සහ විශේෂිත භාවිත මෘදුකාංග, දත්ත සුරැකුම් පිළිබඳ සහ මෘදුකාංග වල සුරක්ෂිත භාවය සහ පරිගණක පද්ධතිවල අඛණ්ඩ සේවාව ලබා ගැනිම හා දත්ත සුරක්ෂිත භාවය වර්ධනය සඳහා ගත හැකි මූලික ක්‍රියා මාර්ග.</td></tr>
</table>

09.2.a දෙවන (2) කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40% |
| 02. මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40% |

09.2.b දෙවන (2) කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 01.ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධයෙන් රජයේ නිළධාරියා සතු මූලික දැනුම පරීක්ෂා කිරිම. |
| 02. මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව මූලික දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම මැනීම. |

09.3.a තුන් (3) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01.කාර්ය විශේෂිත දැනුම | පැය 01 ½ | 100 | 40% |
| 02. විෂයය අනුබද්ධිත අධ්‍යයනය | පැය 01 ½ | 100 | 40% |

09.3.b තුන් (3) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 01. කාර්ය විශේෂිත දැනුම | පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්හි විෂයය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවයන් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේද යන්න හා ගතවූ කාලය තුළ එහි ක්ෂේත්‍රයන්හි සිදුව ඇති නව්‍යකරණයන් පිළිබඳව දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීම. |
| 02. විෂයය අනුබද්ධිත අධ්‍යයනය | කාර්ය පරිපාලනයට අදාළ වන ගැටළුවකට ගතයුතු ක්‍රියාමාර්ග විභාග වන පරිදි බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයීම. |

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

2019.10.01